Library
HDCP
L1
Institute of Human
Resource Advancement

IHRA
UNIVERSITY OF COLOMBO

මනෝවිද්‍යා උපදේශන උසස් ඩිප්ලෝමා
අධ්‍යයන පාඨමාලාව

ව්‍යාපෘති වාර්තාව

# ළමා නිර්මාණශීලී කුසලතා වර්ධනයට රූපවාහිනී කාටූන් වැඩසටහන් සිදුකරන බලපෑම අධ්‍යයනය කිරීම.

අධ්‍යයන වාර්තාව

මනෝවිද්‍යා උපදේශන උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ අවශ්‍යතා සම්පූර්ණ
කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති වර්තාව

HDCP - 236

මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 07
2023 පෙබරවාරි

IHRA
27 FEB 2023

## සාරාංශය

ළමුන්ගේ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් කෙරෙහි රූපවාහිනී කාටූන් වැඩසටහන් කුමන බලපෑමක් සිදුකරයිද යන පර්යේෂණ ගැටලුව මුල් කර ගනිමින් ළමා පරපුරේ නිර්මාණශීලී ක්‍රියාකාරකම් කෙරෙහි රූපවාහිනී කාටූන් වැඩසටහන්හි බලපෑම හඳුනාගැනීම.ළමා පරපුර රූපවාහිනී වැඩසටහන් නැරඹීම කෙරෙහි ඇති පෙළඹවීමේ ස්භාවය අධ්‍යයනය කිරීම. ළමයින් කාටූන් බැලීම හා නිර්මාණශීලී ක්‍රියාවන් අතර සම්බන්ධය. ළමයින් කාටූන් බැලීම පිළිබඳව දෙමාපියන්ගේ සංජානනය යන අරමුණු සාක්ෂාත්කර ගැනීම සදහා මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයෙහි ජාතික පාසලක හා ග්‍රාමිය පාසලක තෝරාගත් ළමුන් 50 දෙනෙකුගෙන් සමන්විත නියදිය තුළින් ප්‍රශ්නාවලියක් මගින් මෙම පර්යේෂණයට අදාලව තොරතුරු එකතු කිරීම සිදු කරන ලදි.එමෙන්ම එම දරුවන්ගේ දෙමාපියන් 10 දෙනෙකු මෙම පර්යේෂණයට අදාළව සම්මුඛ සාකච්ජාවට ලක් කරන ලදි.එම මෙම තොරතුරු මත පදනම්ව වර්තමානයේ විකාශය වන්නා වූ රූපවාහිනී කාටූන් දරුවන්ගේ නිර්මාණශීලීත්වය වර්ධනයට ඍජු බලපෑමක් සිදු නොවන්නා වූ බව අණාවරණය වීය. එමගින් දරුවන් තුළ ධනාත්මක වෙනසක් වර්ධනය වනවාට වඩා සිදුවන ඍණාත්මක තත්ත්වය ඉහළ බව තොරතුරු වලින් අණාවරණය වීය. කාටූන් වැඩසටහන් ජාලය ළමයින්ට දැඩි බලපෑමක් ඇති කරන අතර එය ඔවුන්ගේ ජීවන රටාව, ඇඳුම් පැළඳුම්, ආක්‍රමණශීලී සහ ප්‍රචණ්ඩකාරී හැසිරීම සහ ඔවුන්ගේ භාෂාව මත දැකිය හැකිය, අද ළමයින් එදිනෙදා ජීවිතයේදී කාටූන් චරිතවලට එක ආකාරයකින් බලපෑම් කරයි. කාටූන් වැඩසටහන් දරුවන්ගේ සදාචාරාත්මක ගොඩනැගීමට ඍණාත්මක හා ධනාත්මක බලපෑමක් ඇති කරයි. රූපවාහිනී කාටූන් වැඩසටහන්වලට දැඩි ලෙස නිරාවරණය වීම සදාචාරය පිරිහීමට එක් හේතුවක් බවට තවදුරටත් සැකයක් තිබිය නොහැක. කාටූන් වැඩසටහන් සෑම වයස් කාණ්ඩයකම, ස්ත්‍රී පුරුෂ භාවය, සියලූ සමාජ-ආර්ථික මට්ටම් සහ සියලූ බුද්ධි මට්ටම්වල දරුවන්ට බලපාන බව මෙහිදී වැඩි දුරටත් අනාවරණය වීය.

පටුන

ස්තූතිය.. .......... iii
සාරාංශය .......... iv
පටුන .......... v
ප්‍රස්ථාර නාමාවලිය පිටු අංකය .......... vii
පළමු පරිච්ඡේදය .......... 1
**01.** හැඳින්වීම .......... 1
02. පර්යේෂණ ගැටලුව -: .......... 7
03. පර්යේෂණ අරමුණු -: .......... 7
04. පර්යේෂණ දළ සැලැස්ම .......... 8
දෙවන පරිච්ඡේදය .......... 10
2.1 ළමයා පිළිබඳ සංකල්පීය හා න්‍යායාත්මක විශ්ලේෂණය. .......... 10
2.2. සාම්ප්‍රදායික මාධ්‍ය ළමයා සහ සමාජානුයෝජනය .......... 11
2.3 සාම්ප්‍රදායික මාධ්‍ය .......... 11
2.4 නූතන මාධ්‍ය ළමයා සහ සමාජානුයෝජනය. .......... 12
2.5 නූතන සමාජය .......... 13
2.6 නූතන මාධ්‍ය .......... 14
2.7 නූතන මාධ්‍ය හා නිර්මාණශීලී කුසලතා වර්ධනය .......... 17
තුන්වන පරිච්ඡේදය .......... 20
පර්යේෂණ ක්‍රමවේදය .......... 20
**03.1** අධ්‍යයන ක්ෂේත්‍රය - .......... 20
**03.2** නියැදිය. .......... 21
**03.3** දත්ත රැස්කිරීමේ ක්‍රමය -: .......... 21
**03.4** දත්ත වර්ගීකරණය .......... 22
**03.5** දත්ත විශ්ලේශණය .......... 22
සිව්වන පරිච්ඡේදය .......... 23
දත්ත විශ්ලේෂණය .......... 23
04.1 හැඳින්වීම .......... 23
04.2 තොරතුරු ඉදිරිපත් කිරීම .......... 24

**4.2.1** ස්ත්‍රී පුරුෂ භාවය ........................................................................................ 24

**4.2.2** වයස් සංයුතිය ........................................................................................ 25

04.3 දරුවන් වැඩි වශයෙන් නරඹන නාලිකාව ........................................................................................ 25

04.4 ළමුන්ගේ ජනප්‍රියකම කාටූනය........................................................................................ 26

04.5 දරුවන් වැඩි වශයෙන් රූපවාහිනිය නරඹන වේලාවන්........................................................................................ 28

04.6 නිර්මාණ සඳහා කාටූන් ගීත උපකාර කර ගැනීම. ........................................................................................ 28

04.7 නිර්මාණ සඳහා කාටූන් චිත්‍ර උපකාර කර ගැනීම. ........................................................................................ 29

04.8 නිවසේදී කාටූන් චරිත රඟ දැක්වීම. ........................................................................................ 30

04.9 පාසලේදී යහලුවන් සමඟ කාටූන් චරිත රඟ දැක්වීම ........................................................................................ 31

පස්වන පරිච්ඡේදය........................................................................................ 35

**05.** නිගමන හා යෝජනා........................................................................................ 35

06. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ........................................................................................ 39